# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2002/26 - 2017 ජනවාරි මස 18 වැනි බදාදා - 2017.01.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1)(ආ) වගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1)(ආ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, පරිගණක විද්‍යාව හා පරිගණක පද්ධති සැලසුම් පිළිබඳව විද්‍යාවේදී උපාධි පිරිනැමීමට මග සලසන උසස් අධ්‍යාපනය වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ නීතිගත කරන ලද පුද්ගලික සීමාසහිත වගකීම් සහිත සමාගමක් වන ''ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජිකල් ස්ටඩීස්'' නමැති ආයතනය උපාධි ප්‍රදාන ආයතනයක් ලෙස පිළිගනිමින් 1988 දෙසැම්බර් මස 15 වැනි දින අංක 536/15 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකොට ඇති ඉහත පනතේ 25 අ වගන්තිය යටතේ කරන ලද නියමය, එකී නියමය යටතේ පූර්වයේ කරනු ලැබ ඇති කිසිවකට අගතියක් නොවන පරිදි මෙයින් අවලංගු කරනු ලැබේ.

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2017 ජනවාරි මස 13 වැනි දින,
කොළඹ දී ය.

02 - 96

1A - PG 3342 — 507 (2017/01)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*